# උත්ථාන සමයේ සතරවන සතිය
# බදාදා

## පළමුවන කියැවීම

අපෝස්තුළුවරුන්ගේ ක්‍රියාපොතෙන් ගත් පාඨයෙකි ක්‍රියා 12: 24-13, 5:

**"පාවුළු බර්ණබස් මා කැඳවන කාර්යය සඳහා වෙන් කරන්න."**

දෙවියන් වහන්සේගේ වචනය වර්ධනය වී පැතිර ගියේය. බර්ණබස් ද සාවුල් ද තමන්ගේ මෙහෙය නිමවා මාක් නම් ලත් ජුවාම් කැඳවා ගෙන, ජෙරුසලමෙන් පෙරළා ගියෝය.
අන්තියෝකියෙහි පිහිටි සභාවෙහි දිවැසිවරු ද ගුරුවරු ද සිටියහ. එනම් බර්ණබස් සහ නිගර් නම් සිමියොන් ද සිරේනියේ ලුසියස් ද යුවරජ වූ හෙරෝද් සමඟ ඇතිදැඩි වූ මානායින් ද සාවුල් ද යන මොවුහුය.
ඔවුන් ස්වාමින් වහන්සේට සේවය කරමින් උපවාසයේ යෙදී සිටි විට ශුද්ධාත්මයාණන් වහන්සේ කතා කොට, "මා විසින් බර්ණබස් ද සාවුල් ද කැඳවනු ලැබූ සේවය සඳහා ඔවුන් මට වෙන් කරන්නැ" යි වදාළ සේක. එවිට ඔව්හු උපවාසයේ යෙදී යාච්ඤා කොට ඔවුන් පිට අත් තබා, ඔවුන් පිටත් කර යැවූහ.
මෙසේ ඔව්හු ශුද්ධාත්මයාණන් විසින් යවන ලදුව සිලූකියට බැස ගොස් එහිදී නැව් නැඟී සයිප්‍රසයට ගියහ. සලම්සියට පැමිණි කළ ඔව්හු ජුදෙව්වරුන්ගේ ධර්මශාලාවෙහි දී දෙවියන් වහන්සේගේ වචනය ප්‍රකාශ කළහ. ජුවාම් ඔවුන්ගේ සහකාරයා විය.

දේව වාක්‍යය එසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 67:1-2, 4-5,7

පිළිතුර: අහෝ දෙවිඳුනි, සියලු ජාතීහු ඔබ පසසත්වා!

ගීය:

දෙවිඳාණෝ අප වෙත දයාවෙමින් අපට කරුණාව පෙන්වන සේක්වා!
එවිට මුළු ලොව ඔබේ කැමැත්ත දැන ගන්නේය. සියලු විජාතීහු ඔබේ ගැළවීමේ බලය දැන ගන්නෝය.

ඔබ සාධාරණ ලෙස මිනිසුන් විනිශ්චය කරන සේක.
මිහිපිට සියලු විජාතීන් හට ඔබ මඟ පෙන්වන සේක. එබැවින් සකල ජනයා ප්‍රීතිමත්ව සතුටින් ගී ගයත්වා.

අහෝ දෙවියනි, ජනතාවෝ ඔබ පසසත්වා! සියලු ජාතීහු ඔබ පසසත්වා!
අපේ දෙවිඳාණෝ අපට ආසිරි වස්වන සේක්වා! පොළෝ වැසි සියල්ලෝ එතුමන්ට ගරු කරත්වා.

## සාධුකාරය

ආලේලූයා! ආලේලූයා!
“ඔබ මා දුටු බැවින් අදහා ගත්තෙහිය.
නොදුටු නමුත් අදහන්නෝ භාග්‍යවන්තයෝ ය” යි සමිඳාණෝ වදාරණ සේක.
ආලේලූයා!

# සුවිශේෂය

සුවිශේෂක ජුවාම් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

ජුවාම් 12:44-50

**"මම ලෝකයට ආලෝකයක්ව වැඩියෙමි"**

එවිට ජේසුස් වහන්සේ මහා හඬින් කතා කරමින්, "මා අදහන තැනැත්තේ මා නොව, මා එවා වදාළ තැනැත්වහන්සේ අදහා ගනී. එසේම මා දකින තැනැත්තේ මා එවා වදාළ තැනැත්වහන්සේ දකී. මා ලෝකයට ආලෝකයක්ව වැඩියේ මා අදහන කවරෙකු නමුදු අන්ධකාරයෙහි නොවසන පිණිසය. තවද, යමෙක් මාගේ වචන අසා ඒවා නොපිළිපදින්නේ නම්, මම ඔහු විනිශ්වය නොකරමි. මා ආවේ ලෝකය ගලවන්නට මිස විනිශ්වය කරන්නට නොවේ.
මා ප්‍රතික්ෂේප කර මාගේ වචන නොපිළිගන්නා අය විනිශ්වය කරන්නෙක් සිටී. මා වදාළ ධර්මය මා අන්තිම දවසේ දී ඔහු විනිශ්වය කරන්නේය. මන්ද, මම මාගේම අධිකාරී බලයෙන් කතා නොකළෙමි. මා එවා වදාළ පියාණන් වහන්සේ මා කිවයුතු දෙයත්, දෙසිය යුතු දෙයත් ගැන ආඥාවක් දී තිබේ. උන්වහන්සේගේ යාච්ඥාව සදාතන ජීවනය වන බව මම දනිමි. එබැවින් මා පවසන දේ පියාණන් වහන්සේ මට පැවසූ ලෙසින්ම මමත් පවසමි" යි වදාළ සේක.

සුවිශේෂ වාක්‍යය එසේය.